# මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ පුස්තකාලයාධිපති
# සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධන - අංක : 01.

| ඡේදය අංකය | දැනට තිබෙන පෙළ | ඡේද අංකය | යෝජිත සංශෝධනය | සංශෝධනයට හේතුව |
|---|---|---|---|---|
| 6.3.2.2 (අ) | IV වගන්තිය ඇතුලත්ව නැත | 6.3.2.2 (අ) IV | අනුමත කාර්ය සාධනය ඇගයීමේ පරිපාටිය අනුව පූර්වාසන්න වසර 06 තුළ සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම්කර තිබීම. | සුවිශේෂී කාර්ය සාධනය යටතේ II පන්තියට උසස් කිරීමේ සුදුසුකම් අතරට IV උප වගන්තිය ඇතුලත්ව නොමැති වීම. |
| 6.3.2.3 | (ආ) උප ඡේදය ඇතුලත්ව නැත. | 6.3.2.3 (ආ) | උසස්වීමේ ක්‍රමය:<br>සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයන් 11 පන්තියට උසස් කිරීම, පත්වීම් බලධාරියා විසින් හඳුන්වා දෙනු ලැබූ ආකෘතියක් මගින් පත්වීම් බලධාරියා වෙත අදාල සේවකයා විසින් තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහිතව, සම්මුඛ පරීක්ෂණය / තරඟ විභාගය සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව 111 වන පන්තියට පත්වීම් ලබා වසර 06ක් සම්පූර්ණ වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදුකරනු ලැබේ. සෑම වසරකටම වරක් පමණක් 11 ශ්‍රේණියට උසස්කිරීමේ සම්මුඛ පරීක්ෂණය / තරඟ විභාගය පවත්වනු ලබන අතර ඒ සඳහා පෙනී සිටිය හැක්කේ එක් වතාවක් පමණි. | සුවිශේෂී කාර්ය සාධනය යටතේ II පන්තියට උසස් කිරීමේ සම්මුඛ පරීක්ෂණය හා තරඟ විභාගය සඳහා වන විධිවිධාන ව්‍යවස්ථාවට ඇතුලත්ව් නොමැති බැවින් 6.3.2.3 (ආ) ඡේදය අතුලත් කිරීම. |
| 6.3.3.2 (ආ) | සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් 1 පන්තියට උසස් කිරීම, පත්වීම් බලධාරියා විසින් හඳුන්වා දෙනු ලැබූ ආකෘතියක් මගින් අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහිතව අදාල සේවකයා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව 11 වන පන්තියට උසස් වී වසර 05ක් සම්පූර්ණ වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් බලධාරියා විසින් සිදුකරනු ලැබේ. | 6.3.3.2 (ආ) | සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් 1 පත්තියට උසස් කිරීම, පත්වීම් බලධාරියා විසින් හඳුන්වා දෙනු ලැබූ ආකෘතියක් මගින් අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහිතව අදාල සේවකයා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව 11 වන පන්තියට උසස් වී වසර 06ක් සම්පූර්ණ වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් බලධාරියා විසින් සිදුකරනු ලැබේ. | 1 පන්තියට උසස් කිරීම සඳහා සම්පූර්ණ කළ යුතු කාල සීමාව වසර 05ක් ලෙස දක්වා ඇතත් රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි එය වසර 06ක් ලෙස ඇතුලත් කිරීම. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2013-08-19 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්